

sinhalaebooks.com

සුන්දර කඳු අතර ගලාගිය පෙම් පුවතක්

# ආදර මීනු

කුෂාන් හෙට්ටිආරච්චි

©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

sinhalaebooks.com




# ආදර මීනු ....

කුෂාන් හෙට්ටිආරච්චි.


ආදර මිනු
Author
KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

# ආදර මීනු.




කුෂාන් හෙට්ටිආරච්චි.

PDF ප්‍රකාශනයකි


ආදර මිනු
Author
KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

# ආදර මීනු.....

© කුෂාන් හෙට්ටිආරච්චි.

ප්‍රථම PDF මුද්‍රණය 2017

දෙවන PDF මුද්‍රණය 2022

මෙම කෘතියේ සම්පූර්ණ අයිතිය කතෘ සතුවන අතර නිසි ලිඛිත අවසරයකින් තොරව මෙහි කිසිදු කොටසක් උපුටාගැනීම හෝ කවරාකාරයෙන් හෝ ප්‍රතිමුද්‍රණය,අන්තර්ජාල ප්‍රකාශනය .ව්‍යාජ පිටපත් පළකිරීම,අලෙවිය කිසිදු මාධ්‍යකින් සපුරා තහනම් ය.

**පිට කවර නිර්මාණය**

කුෂාන් හෙට්ටිආරච්චි.


ආදර මිනු
Author
KUSHAN HETTIARACHCHI

# පිදුම

මාගේ ආදරණීය මවට පියාට නැඟනියට සහ බිරිඳට .

ආදර මීනු ....(හැඳින්වීම )

මේ කතාව අවුරුදු 20 විතර පරණ(1999 – 2001 ) කාලයේ කතාවක් මේ කතාවේ සමහර තැන් අද කාලයට නොගැලපෙන්න පුලුවන් සමහර තැන් කතා රසයට හානියක් නොවන අයුරින් වර්ථමාන කාලයට ගැලපෙන ලෙස ලියා තිබෙනවා.ඔයගොල්ලො හැමොම මේක රසවිදියි කියල බලාපොරොත්තු වෙනව...ඒ වගේම ආදරෙන් වැලඳගනියි කියලත් බලාපොරොත්තු වෙනනවා. සම්පූර්ණයෙන්ම මාගේ මනසේ ඇඳී කතාවක් වන මෙය මාගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණයෙන් හෝ මෙහි කොටස් උපුටා ගැනීම,අන්තර්ජාලය හෝ වෙනත් මාද්‍යක පල කිරීම . සපුරා තහනම් වේ.

කුෂාන් හෙට්ටිආරච්චි.

පරමකොටුව පාර,නක්කාවත්ත.

0773 398 938 | 0716 815 899

facebook.com/kushan3000

kushan3000@gmail.com

2017 ජූනි 28


ආදර මිනු
Author
KUSHAN HETTIARACHCHI

ආදර මීනු

මගේ නම "ෂෙහාන් " මගේ අම්මටයි තාත්තටයි හිටපු බාල පුතා මම .ඒ වගේම ගෙදර දඟයත් මම.මමයි අයියයි සිටින පවුලට ගැහැණු දරුවෙකුත් සිටියානම් හොඳ යයි බොහෝ වේලාවල් වලදී අම්මා තාත්තා සමග පවසනු අයියාටත් මටත් ඇසී ඇත. එහෙත් අම්මා ගැහැණු ළමයෙකුගේ මවක් වීමට තරම් වාසනාවන්ත නොවූවාය .ඒ නිසා ඉඩම් නඩු වලින් බේරීමේ වාසනාව මටත් අයියාටත් උපතින්ම හිමිවී තිබුණි. මගේ අයියා පේරාදෙණිය සරසවියේ ඉංජිනේරු පීඨයේ දෙවන වසර සිසුවෙකි.අපි දෙන්න අතර අවුරුදු අටක පමණ පරතරයක් තිබුනි පවුලේ බාලයා නිසා හැමෝගෙම ආදරය මට හිමිඋන අතර මගේ දඟකාරකම් ඉවසන්න විය .

මගේ තාත්තා විශ්‍රාමික විදුහල්පති වරයෙකි. තරමක් සැර උනත් ආදරණීය පියෙක් දයාබර සැමියෙක් තාත්තට නුවර එළිය සහ බන්ඩාරවෙල තේ වතු කීපයක් තිබ්බ .ඒ තේවතු වලින් ලැබෙන

අදායමත් තිබුන නිසා අපට සැපවත් ජීවිතයක් ගත කිරීමට ඕනතරම් මුදල් තිබුනා.

මගේ අම්මා ගෙදරමයි හිටියෙ. මගේ අම්ම මගේ හැම වැඩකටම රුකුලක් උනා ඇත්තෙන්ම පාසලේ තිබුන හැම දේකින්ම විෂය විෂය බාහිර හැම දෙයිම මම ඉදිරියෙන් හිටියා.

අප ජීවත් වූයේ සෙංකඩගල පුරයේ වූ අතර. කඳු වලලෙන් වට වූ මනරම් කුඩා කඳු ගැටයක් මත අප නිවස පිහිටා තිබිනි .සෑම සෙනසුරාදාවකම පාහේ සවස දළදා මාලිගාව වැඳිම පිණිස මහ නුවර යාම අප පවුලේ සිරිත විය.

අපේ අම්මගෙ ගම කුරුණෑගල අම්මගෙ බොහෝ යහලුවො සිටියෙ කුරුණෑගල .මේ අතරින් අම්මගෙ ලඟම යාලුවෙක් හිටිය නිතර ම අපේ දිහා ආව ඒ නිසාමදෝ අපිත් සමහර සති අන්ත වල කුරුණෑගල ඇයගේ නිවසට ගියෙමු. දැනට අවුරුද්දක දෙකක සිට අයියානම් මේ ගමනට සම්බන්ද වෙන්නේ කලාතුරකිනි ඒ ඔහු සරසවියට ගිය පසු නේවාසික වීම නිසාය .ඒ ඔහු සති අන්ත වල නිවසට පැමිණෙනවා බොහොම අඩු නිසාත් ය.

මගේ මවගේ යෙහෙලියට හිටියේ ගැහැණු දරුවන් දෙදෙනෙකි එයින් මම ගොඩක් මිතුරු වූයේ වැඩි මහලු දැරිය සාරංගා අක්කා එක්කය. ඇය ඒ වනවිට උසස් පෙල විභාගය සාර්ථකව නිම කොට සරසවි වරම් බලාපොරොත්තුවෙන් සිටියාය.

අනෙක් දැරිය මීනු ය ඇය මීනු මගේ වයසේ මය. මම මීනුට වැඩි කැමැත්තක් දැක්වූයේ නැත. ඇය තරමක ආඩම්බර කාරියක් කියා මම නිතරම සිතුවෙමි .කැරළි ගැසුන ලා දුඹුරු කොන්ඩය සුදුපාට මුහුණට ගෙන ආවේ අමුතුම සුන්දරත්වයකි. ඇයගේ දෙතොලේ හැම විටම සිහින් සිනාවක් රැඳි තිබින.ඇය ඇස් වලිනුත් සිනාසෙන බව මගේ මව නිතරම කියනු මට ඇසී තිබේ.

මගේ පියා සහ මව සාරංගාට මෙන්ම ඇයට බෙහෙවින් ආදරය කලෝය. ඒ ඔවුන්ට ගැහැණු දරුවන් නොමැති නිසා යයි මම සිතුවෙමි .මීනුට වැඩි කැමැත්තක් නොදැක්වූ මම මෙතෙක් ඇය සමග කතා කර ඇති වචන සංඛ්‍යාව ගිණිය හැකි සංඛ්‍යාවක් කිව හොත් මම වඩාත් නිවැරදියි .ඇය මාත් සමග කතා කරන හැම විටම මම වචනෙන් දෙකෙන් ඇයව මග ඇරියෙමි .

දිනක් එහෙ ගිය විටදී ඇගේ මව මගේ මවට කී දෙයකින් මම තිගැස්සී ගියෙමි.මීනුව දැන් යන පාසලින් ඉවත් කොට නුවර මහාමායා විද්‍යාලයට ඇතුලත් කරණ බවය .මීනුට අපේ දිහා සිට පාසැල් යාමට පුලුවන් දැයි ඇය මගේ මවගෙන් විමසුවාය . මගේ මවත් පියාත් එයට හිස මුදුනින්ම කැමති උනෝය.පුතාටත් හොදයි නෙ මීනුත් ඔයාගෙ වයසෙමනෙ ඇය මා දෙසට හැරී කීවාය මම බිම බලා ගතිමි.

"ඉතින් මගෙ ෆ්රීඩම් ඉවරයි " මම මටම මුමුණා ගත්තෙමි.

මගේ වෙනස දුටුවා වගේ ආන්ටි.

"ෂෙහාන් පුතා නම් වැඩි කැමැත්තක් නෑ වගේ නේද? "

"නෑ නෑ ආන්ටි එහෙම දෙයක් නෑ මටත් පාලු නෑ නෙ එතකොට. "

"ඈන්ටි මම කැන්ඩි වලට එන්නෙ එක එක එක්කෙනාගෙ පාලු මකන්න නෙවේ නේද? "

යයි කියමින් අපේ අම්මට තුරුල් උනේ පූස් පැටියෙක් වගේය .

"මේකිගෙ තියන හුරතලේ ගෙදර තිබ්බ මගෙ තැන අදින් ඉවරයි ඉතින් " මා මටම පවසා ගතිමි.

"ඒකනෙ දූ. "

කියමින් අම්මා මීනුව තුරුල් කර ගත්තාය .

හුටා අම්මත් ඒකටම හරි කාපන්කො දැන් බල මාලු. දැන් මේකි යන්නත් කලින් අපේ අම්මව අල්ලගෙන මොනව උනත් මම පරිස්සන් වෙන්න ඕනෙ අර හැට හතරක් ද මොකක්දත් තියනවලුනෙ ගෑනුන්ට . කොහොමත් මගෙ නිදහස් ජීවිතේ නම් කම්මුතුයි .

ඔහොම සතියක් දෙකක් ගෙවිල ගියා දවසක් ඉරිද හවස ගෙදර ෆෝන් එකට කෝල් එකක් ආවා .

කෝල් එක ආන්ස්වර් කලෙ මම එහා පැත්තෙන් ලාමක ටිං ටිං වොයිස් එකකින් කතා කලේ කෙල්ලක්.

"හෙලෝ ගුඩ් ඊව්නින්ග් මදාරා ඇන්ටි ඉන්නවද? "

"හෙලෝ ගුඩ් ඊව්නින්ග් කව්ද මේ? "

කවුද යකෝ මේ ටෙලිෆෝන් මැනස් තියන් කතා කරන උඩැක්කිය. මම මටම පවසා ගත්තේ මට වැඩිය හුරු නැති වොයිස් එකක් නිසාය .

"හරි හරි අම්මට දෙන්නම් "

මම රිසීවරය තබා අම්මා සොයා ගියෙමි .

"මිස් මදාරා.... මිස් මදාරාට කෝල් එකක්. "

මම අම්මට කතා කලෙමි. මට එහා පැත්තෙන් "හිකිස් " කියල කැකිරි පලනව ඇසුනි .ඇයි අපිත් ටෙලිෆෝන් මැනස් තියනව කියල පෙන්නන්න ඕනනෙ කතා කරන අය නැත්තන් හිතයි අපි හෙන ගොඩේ කියල.

"මිස් මදාරා... කොහෙන්ද මිස් කෑල්ලක් අහිද ගත්තෙ? "

කියාගෙන අම්මා ඇවිත් රිසීවරය අතට ගත්තාය.

"හෙලෝ දූ ඔයාද? "

මම එතනින් මාරු වී එලියට ආවෙමි. පල්ලෙහා පිට්ටනියේ ගමේ කොල්ලො ක්‍රිකට් ගසනවා ඇසේ.

මම පල්ලෙහා පිට්ටනිය දෙසට ඇදුනෙමි.නාදන්ඈත තියාම.

"පුංචි මහත්තය එනවෝ "යි කෑ ගහන්න විය.
නාදන් යනු අපේ වත්තේ මුරකරු කරුප්පන් ගේ පුතයි. නාදන් ට තව අක්කෙක් සිටී ඇය සරස්වති ය.ඔවුන් අපේ සේවකයන් උනත් මම ඔවුන් ව ඇසුරු කලේ මගේ යහලුවන් ලෙසයි .
එතන නාදන්,මොහොමඩ්, සුපුන් ඇතුලු ගමේ තවත් කොල්ලන් කීප දෙනෙකු සිටියහ.
"ෂෙහාන් හෙට නාදන් ලගෙ කෝවිලේ පූජාවක් තියනවලු මූ අපිටත් ඉන්විට් කලා උඹත් එනවද? "යි මොහොමඩ් පවසද්දි.
"ඉස්සරලම උඹ එනවද කියපන් "මම මොහොමඩ් ගෙන් ඇසීමි. මොහොමඩ් මුස්ලිම් උනාට හුගක් හොඳ කොල්ලෙක් එයාලගෙ පවුලෙ අයත් එහෙමයි.
"ඔව් ඔව් මම එනව. "
"එහෙනම් කට්ටියම උදේ සෙට් වෙමු. "
"එහෙනම් දැන් මැච් එකක් ගහමු " ඒ සුපුන් ය.
මම එදා ගෙදර එනකොට හවස හතත් පසුවී තිබුනි...
මම ගෙට ගොඩවෙනකොටම අම්මා

"චුටි පුතා හෙට ඉදන් මීනු මෙහෙ නතර වෙන්න එනවා. " .

"ආහ් අම්මා හෙට නිවාඩු හින්ද මම උදේ ගමනක් අන්න දාගත්තනෙ. "

KUSHAN HETTIARACHCHI

"කොහෙ රවුම් ගහන්න යනවද මේ ළමය? "
"නාදන් ලගෙ කෝවිලේ හෙට පූජාවක් අපි යාලුවො හැමෝම යනවා අනික මීනු එන එක මට එච්චර වැදගත් කමක් නැනෙ අම්ම. "
"මොනව චුටි ඇයි එහෙම කියන්නෙ ඔයා මොකක්ද ඔච්චරම එයා එක්ක තියන තරහ. "
"මම ඒ ආඩම්බරකාරිට කැමති නෑ. "
"අපෝ එකද මේ කෙල්ලො කොහොමත් ආඩම්බරයි ඔය මීනුගෙ අම්ම වසන්තිත් එහෙම තමයි ඉස්සර ආඩම්බර කම ගැහැණු ළමයින්ට උපතින්ම එන දෙයක් නෙ පුතා. "
"ඉතින් අම්මා ගෑනුන්ට උපතින් ආඩම්බර කම එනව කියල පිරිමි අපිට පාං ද? ඉතින්.අම්මගෙ තර්කත් ඉතින් ගෑනුන්ටම තමයි හරියන්නෙ මම යනව වොශ් දාන්න නැත්තන් ඔයාගෙ දේශනා අහල මට නාගන්නත් බැරිවෙනව. "
"හා හා මහත්තයට වැරදිල තියෙයි මේ අම්මගෙ දේශනා ඇහුවොත්. "
මම බාත් රූම් එකට වැදී හොද හැටි නා ගතිමි. දැන් ඉතින් හෙට ඉඳන් පිටසක්වල ජීවිය වගේ තමයි ජීවත් වෙන්න වෙන්නෙ .අර නපුරිච්චි ආව ගමන් මගෙ රාජධානිය එහෙම් පිටින්ම අල්ල ගනියි ආයේ දෙකක් නෑ.
එදින මම මහන්සිය නිසා ඉක්මනින් නිදා ගතිමි.පසුදා උදේ මම නාදන් ලගෙ නිවසට යනවිට මොහොමඩුත් සුපුනුත් අනිත් යාලුවො කීප දෙනත් පැමිණ සිටියෝය.
"පුංචි මහත්තයට එන්න දුන්නද? "

කරුප්පන් මගෙන් අසද්දි.
"ඔව් කරුප්පන් මාමෙ ඔයා දන්නවනෙ මම නිදහස් ජීවියෙක් කියල. "
"හෙහ් හෙහ් මම දන්නවනෙ ඒක අනික පුංචි මහත්තයල ඉතින් වැරදි කරන ළමයි නෙමෙයි නෙ. "
"පුංචි මහත්තය අපි යමු ද? අප්ප තව පරක්කු වෙනව නේද ?මම පුංචි මහත්තයල එක්ක යන්නම්. "
"ආ හොඳයි පරිස්සමින් යන්ඩ. "
අපි කෝවිලට ආවට මෙතන සිද්ද වෙන කිසිම දෙයක් අපි දන්නෙ නෑ නාදන් තමයි කිව්වෙ මේ තියෙන්නෙ ගෙජ්ජි පූජාවක් කියල. ගෙජ්ජි පූජාව කියන්නෙ නැටුම් කරන ළමයින් ට කරන පූජාවක් ලස්සනට කකුල් වල ගෙජ්ජි බැඳල ඒ අය නටනව. ශෝයි ගෑනු ළමයි හත් අට දෙනෙක් ම හිටිය යකෝ මුන් කොහෙද මෙච්චර කල් හිටියෙ .
"ඇයි පුංචි මහත්තය වශී වෙලා වගෙ එකකට හිත ගියාද? "
"නෑ බන් නාදන් මේ කෙල්ලො කොහෙද බන් හිටියෙ මෙච්චර කල් මාර ලස්සනයි නෙ. "
"මචන් නාදන් මුට අර තිබ්බ කෙල්ලො ඇලජික් එක හොද වෙලා වගේ. "
ඒ කින්ඩිය දැම්මෙ මොහොමඩ්.
"හිටපන් තම්බියා උබව එලියෙදි අල්ල ගන්නම්."
මම තරමක් හිමිට ඔහුට පැවසුවෙමි.
"ඇයි අල්ලල බර බලන්නද? "
මොහොමඩ් මගෙ කරට අතක් දා ගත්තේය.

"නෑ බන් උබ මාව මස්සිනා කරගන්න කැමතිද අහන්න. "
"පල පල. "
"මේ නාදන් කන්න දෙන්නෙ නැද්ද බන් මුකුත්. "
ඒ සුපුන් ය උංට කොහෙ ගියත් කන බනේමයි.
නැටුම් උත්සවය ඉවර විය . අපි සැවෝම ගසක් යට වාඩි වී සිටියෙමු. නාදන් දෙවියන්ගේ කිරි බත් තව කැවිලි වර්ග ගොඩක් ගෙනත් ගස මුලින් තැබුවේ බඩජාරියො ටික කාපියව් දැන් කියගෙනය.
මම එකට විතර ආපසු ගෙදරට එන විට මීනු ලා පැමිණ සිටියහ .මීනු වෙනුවෙන් අප නිවසේ කාමරයක් වෙන් විය. නැන්දාත් මාමාත් යන විට පුතා මීනුව හොදට බලා ගන්න කියා යන්න ගියෝය.
බලන්නෙනම් මොනවද ඔය නපුරිගෙ මම මටම කියා ගතිමි .

Author
KUSHAN HETTIARACHCHI

මීනු අපේ පවුලේම කෙනෙක් වෙන්න ගියේ පැය ගානයි . මීනු අම්ම සහ අපේ ගෙදර වැඩට සිටි සුමනා සමග එකතු වී මුළුතැන්ගෙයි වැඩ පවා කලාය .එයින් ඇය අපේ නිවසේ හැමෝගේම ආදරය දිනා ගත්තාය.අම්ම උනත් ඇය කෙනෙකුට හැදින් වූයේ අපේ දුව කියා ය .
බලපල්ලකො ඒකෙත් හැටි මේ චූටි පුතා නිකම්ම ගෙයි මුල්ලකට විසි උනානෙ. දුක නැද්ද අප්පා .මීනු ආ පසු මගේ ජීවිතය සෑහෙන්න වෙනස් වෙන්න ගත්ත.පාසැල ඇරී ගෙදර ආ පසු යලි මා එලියට ගියේ නම් ඒ කලාතුරකිනි ඒත් නාදන් ලා එක්ක

සෙල්ලම් කිරීමට ය .මම පොත පතට ඇලී පොත් ගුල්ලෙකු වී සිටියෙමි .මීනු නම් සමහර දින වල සුමනා සමග වත්ත උඩහ ඇති දිය ඇල්ල වෙත ගියාය. මේ වන විටත් මම මීනු සමග වැඩි කතාබහ නොකලෙමි.

කාලය කෙමෙන් කෙමෙන් ගතවිය එදින සෙනසුරාදා දිනයකි.මම උඩහ දිය ඇල්ල ගාව තිබු ගලක් මතට නැගී දිය ඇල්ල දෙස බලාගෙන සිටියෙමි. බොහෝ විට තනිව මෙම ස්ථානයට පැමින මෙලෙස දිය ඇල්ල දෙස බලා සිටීමට මම බොහෝ ප්‍රිය කලෙමි .

"ෂෙහාන් " මීනු ලඟට ඇවිත් කතා කරන තුරුම මට ඇයව පෙනුනේ වත් එනවා දැනුනේවත් නැත. කලුපාට අත් කැපූ ගවුමක් ඇය හැඳසිටියාය.ඇයට එම ගවුම කදිමට ගැලපුනි සුමනාද ඇය පසෙකින් සිටියාය .

"හරි ලස්සනයි ෂෙහාන් . "

"මමද ?"

මම ඇසුවෙමි පෙනීමේ දොශයක් වත් තියනවද දන්නෙ නැනේ.

"අපෝ නෑ මම කිව්වෙ මේ දිය ඇල්ල. "

"ආ ඇත්තද අපිවගේ අය ඉතින් ඔයාල වගේ අයට ලස්සන නැනේ "

මම කීවෙමි .

"අනේ නෑ ඔයයි දිය ඇල්ලයි එකට තියනකොට තමයි ගොඩක් ලස්සන. "

"අනේ ඇත්තද යනව යන්න නිකන් බටර් ගාන්නේ නැතුව. "

"අපෝ යනව යන්න නපුරා. "

"ඔයා තමයි නපුරී.  මේ ඒක එවෙයි. "

"එහෙනම් මොකක්ද නපුරෝ... "

"ඔයත් මෙතෙන්ට ආවනම් තමයි ගොඩක් ලස්සන වෙන්නෙ. "

මම විහිලුවක් කලෙමි සුමනාද පසෙකට වී සිනාසුනාය.

මීනු සහ මම විහිලු කලේත් වැඩිපුර කතා කලේත් එදාය. ටික ටික මීනුගේ ඇසුර මට ප්‍රිය විය .පිටින් පෙනුන ආඩම්බර කාරිය නෙවෙයි ඇය සුන්දර කෙලිලෝල් කෙල්ලක් බව පසක් වීමට මට මෙච්චර කල් ගියේ ඇයි කියල මටම හිතා  ගන්න බැරි උනා .

නිවාඩු  කාල වලදී මීනු ගෙදර ගිය විට මට වෙන නිවාඩු කාලවලදී මෙන් නොව දැඩි පාලුවක් දැනෙන්න විය .මේක ආදරයද වෙන මොන කෙහෙල්මලක් ද කියා මම නොදනිමි. මීනු මගේ මුලු ආත්මයම ආක්‍රමණය කර ඇති බවනම් නිසැකයි.

දිනක් නාදන් මට පාරෙදි හමුවී.

"දැන් පුංචි මහත්තය අපිව බලන්න එන්නෙ නෑනෙ තරහ වෙලාද අපිත් එක්ක. "

"පිස්සුද නාදන් මම උබ එක්ක තරහ වෙනවද? උබ මගෙ සහෝදරය වගේ නෙ , මම දැම්ම ඉදන්ම එක්සෑම් වලට රෙඩි වෙනව මම ඔහුගේ අතින් අල්ලන් පැවසුවෙමි. "

නාදනුත් මගේ වයසේ ය.

"ඒකනම් ශොද යි තමයි. "

"නාදන් ගෙ පාඩම් වැඩ කොහොමද? "

"මමත් කරගෙන යනව තමයි මදාරා නෝනා අප්ප අතේ ශල්ලි එවනවනේ මට ඉගන ගන්න පුංචි මහත්තයගෙ අම්මයි අප්පයි තමා ඒව ගැන හොයන්නෙ ඒව මට කවඩාවත් අමතක වෙන්නෙ නෑ පුංචි මහත්තය ආවෙ නැති හින්ද හිතුව තරහ වෙලා කියල. "

"එහෙම එකක් නෑ බන් උඹ දන්නවනෙ. "

"කව්ද පුංචි මහත්තය අර එහෙ ඉන්න ලශ්ශන නෝනා. "

"කව්ද බන්. "

"අර ඉන්නෙ මන් දැක්ක දවසක්. "

"ආ ඒ මීනු අපෙ අම්මගෙ යාලුවෙක් ගෙ දුවක් එයා ඉස්කෝලෙ යන්නෙ මෙහෙ ඉදල. "

"ආ ශරි ශරි. "

නාදන් කිව්වේ ටිකක් අමුතුවට මා දෙස බලන ගමන්

“මොකද නාදන් ඒක නිකන් අමුතුවට කිව්වෙ ”

“නෑ පුංචි මහත්තය නිකන් “

"හරි නාදන් මම යන්නම් බන්. "

"හා පුංචි මහත්තය. "

මම හිමින් හිමින් ගේ දෙසට එන්නට හැරුනෙමි .

“මම ඇත්තටම යාළුවන්ගෙන් ඈත් වෙලාද ? ඒකට හේතුව මීනුද ?”

මම මගේ හදවතට තට්ටු කර ඇසුවෙමි.

කෙතරම් මොලය වෙහෙසුවත් ඒ ප්‍රශ්නයට පිළිතුරක් නම් මගේ මනසට ආවේ නැත .

මේ අතර නිකුත් වූ උසස් පෙල ප්‍රතිඵල වලින් මීනු ගේ අක්කා සාරංගා පේරාදෙණිය සරසවියේ වෛද්‍ය පීඨයට තේරී තිබුනි. මගේ අයියා මේ වන විට ඔහුගේ විශ්ව විද්‍යාල අවසාන විභාගයට සූදානම් වෙමින් සිටි අතර ඒ නිසා ඔහු ගෙදර ආවේද ඉතාමත් කලාතුරකිනි. මීනුත් මමත් මේ

වන විට සාමාන්‍ය පෙළ විභාගයට සූදානම් වෙමින් සිටියෙමු.

විභාගයද කෙමෙන් ලංවිය විභාගයට කලින් දින අප පවුලේ සැවෝම දළදා මාලිගාවට බාරයක් වීමට ගියෙමු .දළදා මාලිගාව තුලදී .මීනුත් මමත් බොහෝ වේලාවක් දළදා වහන්සේ ඉදිරියේ රැදී සිටියෙමු. මීනු ආගමික වතාවත් සිදුකරන තෙක් මම පසෙකට වී සිටියෙමි .

එය ඉවර වූ පසු.

"මොනවද මෙච්චර වෙලා ප්‍රාර්තනා කලේ "මම ඇසුවෙමි .

"අපි දෙන්නම හොදට විභාගය පාස් වෙන්න කියල ප්‍රාර්තනා කලේ. " යි පවසා ඇය අහිංසක ලෙස සිනා සුනාය.

ආදර මීනු
Author
KUSHAN HETTIARACHCHI

***

කෙමෙන් කෙමෙන් විභගයත් ලං විනි අපි විභාගයට හොදින් සූදානම් උන නිසා සාර්ථකව මුහුණ දුනිමු. අවසන් දින විභාගය අවසන් වී ගෙදර යන විට ප්‍රතිඵල එනතෙක් කුමක් කරන්නේදැයි මීනු මගෙන් විමසුවාය .
"ෂෙහාන් නිවාඩු කාලේ ඔයා මොකද කරන්නෙ? "
"මම නම් කොම්පියුටර් කෝස් එකක් කරනව. ඔයා මොකද කරන්නෙ මීනු ?"

"මමත් කොම්පියුටර් කෝස් එකක් නම් කරන්න ඕනේ මම නම් කුරුණෑගල කෝස් එක කරන්න තමයි හිතුවෙ. "

"එහෙමද ඔයා කැන්ඩි වල කලානම් අපි දෙන්නටම එකටම කරන්න තිබ්බ නේද?"

"ඔව් ඉතින් ඒත් මට කුකරි ක්ලාස් යන්නත් ඕනේ. "

"පවු ඉතින් කවද හරි ඕව කන එකාට නිවන් සැපම තමයි. "

"අනේ යනව යන්න මෝඩයෝ එහෙම නෑ එයා මට මුකුත් කියන්නෙ නෑ එහෙම. "

මගෙ හිත කිරි ගැසී ගියේය.

"ඒ කියන්නෙ දැන් එහෙම කෙනෙකුත් ඉන්නවද? "

"ඔව් ඇයි ජෙල ද? "

"අනේ මට මොකො මන් මොකටද ජෙල් වෙන්නෙ ඔයා මගෙ කවුරුත් නෙවෙයි නේ. "

මීනුගේ මුහුණ වෙනස් විය.

"මම ඔයාගෙ කවුත් නෙවෙයි ද ෂෙහාන් ."

"මට එහෙම අයිතියක් නැතිව මම කැමති නෑ අයිතිවාසිකම් කියන්න. "

"මොඩ කොල්ල පිස්සුද මන්ද කොල්ලෙක් කියල ලඟින් ආශ්‍රය කරන්නෙ ඔයාව විතරයි ඉතින් මට කොහෙන්ද අනේ බෝයි ෆ්‍රෙන්ඩ් ල මාව අයිති තාමත් මගෙ අම්මටයි අප්පච්චිටයි "යි කියමින් මගෙ මුහුණට එබුනාය.

මගේ ගිනිගත් පපුවට කූල් වතුර එකක් දැම්ම වගේ.. මොන උලව්වක් ද මේක ආදරේ ද මටනම් තේරෙන්නෙ නෑ.

අපි කතාවෙන් කතාවෙන් මාළිගාව ළඟටම ඇවිත් සිටියෙමු .
ඇය යලිත් ඇගේ නිවසට ගිය විට ඇයව යලිත් මට නිතර මුන නොගැසෙනු ඇත. අපි දෙදෙන නුවර වැව රවුම දිගේ ඇවිද ගියෙමු .අප ඉස්සරහට ආවේ නාදනුයි මොහොමඩුයි සුපුනුයි.
"අම්මට සිරි හනිමූන් කපල් එක කොහෙද මේ? "
තම්බියා උගේ වක්කඩ ඇර ගත්තේය.
"අම්මපල්ල මේ තම්බියගෙ කටේ සංවරයක් නැති හැටි" මට ගත් කටටම කියවුනි.
"උඹට ඉතින් තද උනාද බන් "මොහොමඩ් මගේ අතින් අල්ලන් ඇසුවේය.
"පිස්සුද බන් උබල තුන්දෙනා ඉතින් මගෙ සහෝදරයො වගේනෙ නෑ බන් මීනු ගමේ යනව හෙට, ආයේ කාලෙකට එන්නෙ නෑ ඉතින් ටිකක් ඇවිදල එන්න යනව. "
"ඒක නම් හොදයි එහෙනම් පලයල්ල අපිත් යනව. "

"ඔයාලට එක්සෑම් කොහොමද? "
එසේ ඇසුවේ මීනුයි.

"අපි තුන්දේනාටම එක වගේ තමයි මිශ් අනික පේපරේ ඔන්දම කොලේ ගහල එවල තිබ්බෙ "

නාදන් කැඩිච්ච සින්හලෙන් කියද්දි අපි හැමෝටම සිනා නවත්තගන්න බැරි විය.

අපි ඔවුන්ගෙන් වෙන්වී වැව රවුමේ ඇවිද අවෙමු.

"මීනු. "

sinhalaebooks.com

"ම්ම්ම් ඇයි ෂෙහාන් ? "

"ඔයා කැන්ඩි වලට කැමති නැද්ද? "

"ෂෙහාන් මම ලංකාවෙන් කැමතිම කැන්ඩි වලට. "
"ඉතින් ඔයාට පුලුවන්නෙ මාත් එක්ක මෙහෙ ඉඳල කෝස් එක කරන්න. "
"මම කිව්වනෙ ෂෙහාන් මම කැමතියි නිවාඩුවට ගෙදර ඉන්න අනික කුකරි ක්ලාස් යන්නත් ඕනෙ නෙ. ඉතින් මම ඔයා බලන්න එන්නම් කො අනික මම ඉක්මනින් එනවනේ මම ඒ ලෙවල්ස් කරන්නෙ මෙහෙනෙ. "
ඇයව කෙසේවත් එකඟකර ගැනීමට මට නොපුලුවන් විය .එදින හවස මම දැඩි ලෙස උනෙන් පෙලෙන්නට වීමි. අම්ම මට බෙහෙත් දී මාව ඇඳෙන් හාන්සි කලාය. මීනු මම ලඟටම වී සිටිමින් මගේ අවශ්‍යතාවයන් සපුරාලූවාය.අම්මා කිහිපවිටක් නිදා ගන්නලෙස පැවසුවත් ඇය මා ලඟින් හෙල උනේ නැත .
***
උදෑසන වන විට මට සැහෙන්න සනීප වී තිබුනි .මීනු නිදි මැරීම නිසා ඇයගෙ ඇස් රතුවී තිබුණි .මීනු ඇගෙ නිවසට යන්න ලෑස්ති වෙමින් සිටියාය .තාත්තා ඇයව රැගෙන යාමට කැබ් එක සූදානම් කරගෙන සිටියේය . යන්න කලින් මම මීනු ලඟට ගියෙමි .
"ඇයි දුකින් වගේ ෂෙහාන් අමාරුද ඔයාට. "
ඇය මගෙන් විමසුවාය

"ඇයි මම දුකින් වගේ පේනවාද "කියා මම ඇසුවෙමි.
"ඔව් ඔයා ගොඩක් දුකින් වගේ. "
"ඔයා කැමතිද මම සතුටින් ඉන්නව දකින්න. "
"ඔව් අනිවායීයෙන්. "
"එහෙනම් ඔයා ඉක්මනට එන්න මීනු ඔයා නැතිව මට හුගක් පාලු තියෙයි. "
"ඔයාට එච්චර පාලුද මාව නැතුව ඒත් ෂෙහාන් අපිට හැමදාම මෙහෙම ඉන්න බැනෙ අනික මම යන්නම යනවත් නෙවෙයි  නෙ මම ඉදල හිටල එනවනෙ. "
"මේ දෙන්නගෙ කතාවෙනම් ඉවරයක් නෑ අපි යමු නේද දුව. "
යි කියමින් අම්ම ලඟට ආ නිසා කතාව නැවතිනි මීනු අම්මාත් තාත්තත් සමග පිටත් වී ගියාය . මම අසනීප තත්වය නිසා ගෙදර නැවතුනෙමි.මීනු ගියපසු නිවස පාලු සොහොන් පිට්ටනියක් බදු විය. කාලය සෙමෙන් ගතවිය .

මේ අතර මගේ අයියා ඉංජිනේරුවෙකු ලෙස රජයේ දෙපාර්තමේන්තුවක සේවය කලේය. ඔහු සේවා කලාපය කුරුණෑගල විය .අවුරුදු වලටත් කලින්ම අපේ සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නිකුත් විය .මීනු දුරකථනයෙන් කතා කොට ඇය එනතෙක් සිටින ලෙස පැවසූ නිසා මම ඇය එන තෙක් සිටියෙමි. මධ්‍යන දොලහ පමණ වන විට ඇය පැමිණියාය. අපි දෙදෙනා හවස දෙක පමණ වන විට ප්‍රතිඵල බැලීමට ගියෙමු ඉස්සරලාම අප ගියේ මීනු ගේ

විදුහලටයි .ඇය විශයන් අටටම විශිෂ්ට සම්මාන ගෙන ඉහලින්ම පාස් වී තිබුණි ඉන්පසු සතුටින් අපි ගියේ මගේ පාසලටයි . මම විශයන් හතකට විශිෂ්ට සම්මානද එක විශයකට සම්මාන සාමාර්ථද ලබා තිබුනි .

විදුහලින් එලියට එද්දි .

"ෂෙහාන් අපි වැව රවුමට යමු මට ඔයාට කියන්න වැදගත් කතාවක් තියනව. "

අපි වැව රවුමට ගියෙමු.

මීනු කතාව පටන් ගත්තාය.

"මේක මම ගෙදර ගියාට පස්සෙ දැනගත්තෙ අපි දෙන්න දැන් නෑනයි මස්සිනයි වෙන්න යන්නෙ. "

"මොනව? මීනු."

ආදර මීනු ....

ආදරේ තිළිණය ඔබේ
ඔහු අතට දෝතින් දේවි
ලොව දිනා සැනසුම ලබා
ඔහු ඔබ සමග සැනසේවි
ඔබ නමින් මා මැවූ පෙම් සිහින
කඳුලු විල කිමිදේවි
පිපුන සිත මිලින වී
දුක් හඬින් ගොලු වේවි

කුෂාන් කුෂී ^

sinhalaebooks.com

"ඔව් ෂෙහාන් මමනම් හරි සතුටින් ඉන්නෙ මේ ගැන මොකද ඔයා අමුතු උනේ මේ දාඩියත් දාල ඇයි කැමති නැද්ද මාව නෑන කරගන්න. "
"න්න් නෑ එහෙම එකක් නෑ මී.. නු ..."
"මොකද මේ ෂෙහාන් ඇස් වල කඳුලු ශිකේ ගෑනු ළමයෙක් වගේ නෙ. "
කඳුලු නැති වෙයි ද මගේ මීනු අයිය මැරි කලාම.
"ෂෙහාන් ."
මම පියවි සිහියට ආවේ මීනු මගෙ නම කියමින් මගෙ මුහුණට එබෙද්දීය. එක්සැම් ගොඩ ගිය සතුට හොරු අරන් ගියා වගේ .
"මොකද ළමයො මේ."
"කියන්න මීනු මම අහන් ඉන්නෙ. "
ඕනම දුක හිතෙන කතාවක් දරා ගැනීමෙ අදහසින් මම පැවසීමි.
"අපෝ මේ ළමයට මොනව වෙලාද මන්ද අපේ අක්කයි ඔයාලගෙ අයියයි දෙන්නගෙ එෆයාර් එකක් තිබිලනෙ මුන් දෙන්න තමයි නියම හොරු. "
"මොනව මීනු ඔය ඇත්තමද කලින් කියන්න එපැයි හලෝ. "
"කියන්න යද්දි ඉතින් මූඩ් ගැහුවනෙ. "
අම්මෝ ඇති අපෙ අයිය කාරය ලයින් දාල තියෙන්නෙ සාරංග අක්කටනෙ කියන්න බැනෙ ඉන්නෙත් කුරුණෑගල හින්දා මීනුට ලයින් දැම්මද කියල මගෙ වෙලාව තාම හොඳයි .
"ඉතින් ඉතින් මීනු කියන්නකො. "

ගිය සතියෙ ඇන්ටියි අංකලුයි කුරුණෑගල ආවෙ ඔක කතා කරගන්න. දෙන්නගෙ ලව් එකට අවුරුදු දෙකක් විතරලු. දැන් කොහොමද අපි දෙන්නව හලල මුන් ගේම ගහල තියන හැටි. "
"ඒකනෙ මීනු කමක් නෑ ඉතුරු ටිකත් ඔහොම්මම කර ගත්තාවෙ මැට්ටො දෙන්න. "
"ආ දෙන්න පැනල යන්නද? "
හඬ ආ දෙස අපි දෙන්නම හැරී බැලුවෙමු මොහොමඩුයි නාදනුයි හිනා වේගන අපි දෙන්න දිහා බලා සිටියෝය.
"ඔක්කටම කලින් කියපල්ල රිසල්ට්. කෝ සුපුනා? "
"නාදන් අටයි පහයි මම හතයි පහයි. "
"නියමයි නෙ මොහොමඩ් උබ මොනවද ෆේල්? "
"යකෝ ඕක අහන්න එපා කියන්න ලැජ්ජයි. "
"කියපන් බන්. "
"ඉංග්‍රීසි බන්. "
"ඊලඟ සැරේ ගනින් බන් ඕක මොකක්ද සුපුනගෙ කොහොමද ඔකනම් වැඩක් කලේ නෑ. "
"අඩෝ උබ මට එහෙමයි නේද සලකන්නෙ. "
ඒ සුපුන් ය මොනවදෝ පාර්සල් දෙක තුනක් ඔහු අතේ තිබිනි.
"උබල දෙන්න ඔතන ඉන්නව දැකල මම මේ වඩේ ටිකක් අරන් ආව සල්ලි තිබ්බෙ ඔච්චරයි. "
මට සුපුන් ගැන දුක හිතුනි.
"සොරි මචන් එක්සෑම් අවුලක් නෑ නේද? "
"නෑ බන් හයයි පහයි ගණනුයි විද්‍යාවයි පාස් ඒ සතුටට මේව ගෙනාවෙ "

"ඕවත් අරන් අපි අතන බංකුවට ගිහින් කමු " මම පැවසීමි.
අපි වඩේ කා එන්න පිටත් උනෙමු මීනුයි මමයි ගෙදර ආ අතර නාදන් ලා තව පරක්කු වෙන බව පවසා නතර උනෝය .අපි නිවසට ආ පසු අපදෙදෙනාගේ ප්‍රතිඵල අසා දෙමව්පියෝ සතුටු උනහ .මීනු ඇගේ නිවසට දුරකතන ඇමතුමක් දී ප්‍රතිඵල දැනුම් දුන්නාය. ඇය එදින අප නිවසේ නතර උනාය.අම්මාත් තාත්තත් නාදන් ගේත් අනිත් දෙදෙනාගෙත් ප්‍රත්ඵල අසා සතුටු උනෝය .කරුප්පනුත් නාදනුත් රෑ අපේ නිවසට ආවේ ප්‍රත්ඵල කීමටයි. ඔව්න් දෙදෙනා ගියේ රාත්‍රී ආහර අපේ නිවසින් ගැනීමෙන් පසුවයි.රෑ නින්දට යන වෙලාවේ අම්මා.
"මීනු දුව හෙටත් ඉන්නව නේද?"
"ඔව් ඇන්ටි හෙට උදේන්ම මාලිගාවට යන්න ඕනේ.
"
"හා දුව එහෙනම් නිදා ගන්න "
"ගුඩ් නයිට් ඇන්ටි. "
"ගුඩ් නයිට් දුව. "

පසුදින උදේ මීනුත් සුමනාත් අම්මාත් මාලිගාවට ගියෝය. මම නාදන් සමග මොහොමඩ් ලාගේ නිවසට ගියෙමි. ඒ වන විට සුපුන් මොහොමඩ් ලාගේ නිවසට පැමිණසිටියේය. අපි මේ එක් උනේ .සිංහල අලුත් අවුරුද්දට අපි කරන්න හිතන් ඉන්න අවුරුදු උත්සවය ගැන කතා කර ගැනීමටය.

KUSHAN HETTIARACHCHI

අපි ගෙදර ආවේ දහවල් කෑම මොහොමඩ් ලාගේ නිවසින් ගැනීමෙන් අනතුරුවයි .
මා එනවිට අම්මලා ඇවිත් සිටියහ. හවස හතරට පමණ මමත් මීනුත් කතා කරමින් උඩහ දිය ඇල්ල වෙත ගියෙමු .
"ඉතින් ෂෙහාන් කොහොමද? "
"හොඳයි මීනු ඔයා අද හරි ලස්සනයි නෙ. "
මම කීමි.
"ඇත්තද තෑන්ක් යූ ෂෙහාන් මම එච්චර ලස්සනද? "
"ඔව් නෙ ලස්සන දේට ලස්සනයි කියන්න ඇඹරෙන්න ඕනේ නෑනෙ. "
"ඒක ඇත්ත. "
"මට ඔයාට කාරණයක් කියන්න තියනව, මම කිව්වට කමක් නැද්ද? "
"කියන්න මොකක් හරි ගොන් කතාවක් ද? "
"අපෝ ගොන් කතා කියන්න ඕන එළදෙන්නුන්ටනෙ ඔයා එළදෙනක් ද ?"
"අනේ යනව යන්න මෝඩයෝ කතාව කියන්නකො. "
"අද සුමනා ආවෙ නැති එක හොඳයි නේද? "
"හ්ම්ම් ඔව් ඒත් එයා හරි හොඳයි නේ. "
"ඔයාලගෙ අක්කයි අපේ අයියයි හොඳට මැච් වෙනව නේද? "
"ඔව් ඉතින් ඒකනේ එයාල යාලු වෙලා තියෙන්නෙ ඉතින් ඒකද කියන්න තියන කාරණය. "
"නෑ මට හිතෙනව මීනු අපි දෙන්නත් හොඳට ගැලපෙනව කීයල මම ඔයාට කැමතියි. "

sinhalaebooks.com

"මොනව ඔයා හොඳ සිහියෙන් නේද කතාකරන්නෙ? අපේ අම්මල කවදාවත් කැමති වෙන්නෙ නෑ දුවල දෙන්නම එක ගෙදරට එවන්න. "

"ප්ලීස් මීනු තෙරුම් ගන්න මම ඔයාට හුඟක් ආදරෙයි. "

"ඔයා පරක්කු වැඩියි ෂෙහාන් අනික ඔයා මෙහෙම දෙයක් කියනව කියල දන්නවනම් මම කවදාවත් ඔයත් එක්ක මෙතෙන්ට එන්නෙ නෑ. "

"මොකක්ද පරක්කු කතාව. "

"ඒවයෙන් දැන් වැඩක් නෑ මම යනව දැන්. "

යි කියමින් ඇය නිවස දෙසට පිය මැන්නාය .

මමද මද වේලාවක් දිය ඇල්ල දෙස බලා සිට නිවස වෙත ගියෙමි .එදින සිට මම යලිත් ගොලු චරිතයක් උනෙමි .ඒ වගේම මීනුත් මාත් අතර වැඩි කතා බහක් නොවීය .ගමේ අවුරුදු උත්සවය නිසා මම තරමක් දුරට කාර්යබහුල වී සිටියෙමි .ඒ නිසා මම මීනු ගැන වැඩි තැකීමක් නොකලෙමි. කාලය ටිකින් ටික ගතවිය අවුරුදු උත්සවය දිනයද ලං විය .ඒ අවුරුදු දිනයට පසු දිනයයි. අපගේ සිංහල හින්දු අවුරුදු උත්සවය අප සෙල්ලම් කරන පිට්ටනියේ පැවැත්වීමට කටයුතු යොදා තිබින. සංවිධායක කමිටුවේ මාත් සිටි නිසා මම උදේම එතනට ගියෙමි.උදේ සිටම විවිද ක්‍රීඩා පැවැත්විනි. අයියාත් ගෙදර සිටි නමුත් මීනු ලාගෙ ගෙදරින් එන නිසා ඔහු නතර විය. උදෑසන එකොලහට පමණ සෙනග අතරේ අයියාත් සාරංගා අක්කාත් ඉන්නවා දුටිමි. මාගේ දෑස සෙව්වේ මීනුයි .මීනු සිටියේ තනියම

නොවෙයි සුදු උස මහත හැන්ඩ්සම් කොල්ලෙක් සමග ඇය සිනාසිසී අවුරුදු උත්සවය නරඹයි .
කවුද යකෝ මේ බුවා මම මටම කියා ගතිමි. මේ නපුරීට මම ඉන්නවද ගානක් නැතිව ඇති හැටි.ගානක් තියෙන්න මම එයාගෙ කවුරුත් නෙවේ නෙ .මම අහක බලා ගතිමි .එවිටයි මම දුටුවේ මොහොමඩ් මට පිටුපසින් සිටි වග .
"මොකෝ සහෝදරය කතාව දුක්බරයි නේද කිරිල්ලි වෙන කුරුල්ලෙක් එක්ක ඉගිල්ලිලාද? "
"කවුද දන්නේ මොහොමඩ්. මට ඔය කොහෙවත් ඉන්න උන් ගෙන් වැඩක් නෑ අනික මම එයාගෙ කවුරුත් නෙවෙයි නේ. "
"හරි හරි බොස් ඒක ඔයාගෙ වැඩක් නේ ඒත් කොහෙවත් යන කෙල්ලො හින්ද උඹ පොඩි එකෙක් වගේ අඬනවට අපි කැමති නෑ බලපන් ඇස්වල කඳුලු. "
එවිටයි මට තේරුනේ මගේ දෑස් වල කඳුලු බව.
"නෑ මොහොමඩ් මම අඬන්නෙ නෑ .අපි ඊලඟ ඉවෙන්ට් එක ගැන බලමු. "
"මචන් ඊලඟට තියෙන්නෙ බැලුම් ඩාන්ස් එක මම කියන්නද වැඩක්. "
"මොකක්ද බං. "
"ශෝයි කෙල්ලක් ඉන්නව උබ දිහා ඇහැ දාගෙන මම කීප සැරයක් දැක්ක ඒකි එක්ක බැලුම් ඩාන්ස් එක දාමුද මම සෙට් කරන්නම්. "
ඔහු කිව් දෙස මම බැලුවෙමි අම්මට සිරි ඔය ඉන්නෙ එල කිරෙන් නාල වගේ සූකිරි බෝල කෙල්ලක් .

"හ්ම්ම්. "
"ඉඳපන් මම කතා කරන්නම්. "
දෙන්නම් මීනු ඇට්ටි හැලෙන්න. ඒත් ඉතින් මම කෙල්ලක් එක්ක බැලුම් ඩාන්ස් දැම්ම කියල මීනුට පාන් ද ඒකි අරූ එක්ක මගෙ ඩාන්ස් එකත් බලල හිනා වෙලා යයි .
මොහොමඩ් කියපු කෙල්ලත් සමග ඔහු මා ළඟට ආවේ ලවුඩ්ස්පීකර් වලින් බැලුම් ඩාන්ස් තරඟයට ඉදිරිපත් වෙන තරඟ කරුවන් පිට්ටනිය මැදට පැමිනෙන්න ලෙස කියද්දියි. මම මොහොමඩ් සමග පැමිණි කෙල්ලගේ අතින් අල්ලාගෙන පිට්ටනිය මැදට ආවමි. මීනුත් අර ගෙම්බාත් ඉස්සරහින් දෙදෙනාටම පේන්නය .මීනුත් ඔහුත් සිටි තැන වීල් චෙයා එකක ඉඳගෙන මා දෙස බලා සිටි යුවතිය මා දෙස බලාගෙනම අහිංසක ලෙස සිනා සුනාය.මට දැන් කාගෙන්වත් වැඩක් නැත මට තිබුනේ කෝපයක් සහ දුකක් විතරයි. මීනුගේ මුහුන වැසි වසින කල අහස මෙන් අඳුරු වී තිබුනි .මීනු ඔහොම නෙවෙයි මේ පටන් ගත්ත විතරයි ඔයාට තව රිදෙයි ආයෙ මම ඔයා දිහා බලන්නෙවත් නෑ මම මටම කියා ගතිමි .
"මොනවද අයියෙ තනියම කියවන්නෙ? "
හුටා මේකිටත් ඇහුනද ඒක.
"න්..නෑ ..නංගි ඔයාගෙ නමවත් දන්නෙ නැනෙ මම. "
"ඔව් නේද මම නිකිණි, අයියා ෂෙහාන් නේද? "
"ඔව් මම ෂෙහාන් තමයි කොහොමද දන්නෙ? "

"ඒ විදිහෙන් වැඩක් නෑනෙ මම දන්නවනෙ මේ ඒක නෙවෙයි අපි දෙන්න වින් කරන්න ඕනේ හොඳද?"
"ඕ කේ "
යකෝ මේක මාර කෙලියක් නෙ කතා කරලත් විනාඩි පහයි මේකි මගෙ වයිෆුත් වෙලා ඉවරනෙ ...
තරගය පටන් ගති මමත් නිකිනිත් තරගය කරගෙන ගියෙමු. ඒ අතර මම මීනු දෙස හොරහින් බැලුවෙමි ඇයගේ මුහුන අදුරේ ය .හිතන්න ඇති අපිට කෙල්ලො නැහැ කියල .
"අයියා ධර්මාශෝකෙ නේද? "
"ඔව් කොහොමද දන්නෙ? "
"මම ඔයා ගැන ටිකක් දන්නව. "
"මොනවද දන්නෙ? "
"මම ඔයාගෙ ෆේස් බුක් එකෙත් ඉන්නව. "
"අහ් එහෙමද? "
"ඔව් හෙමයි. "
මට දැන් මොහොමඩයව අල්ලල පොලේ ගහන්න පුලුවන් කොහෙදෝ යන මරාලයක් නේ මේක. මොනව උනත් කෙල්ල ලස්සනයි බෝනික්කි වගේ කොහොමින් කොහොමින් හරි නිකිණියි මායි තරඟෙ දිනුව ..
තරඟ ඉවරවී අවුරුදු උත්සවේ නිමාව වන විට හවස තුන පමණ විය මම එන විට ඒ වෙනකොට අයියලාත් මීනුත් යන්න ලෑස්ති වී සිටියෝය මම මීනුව ගනන් වත් නොගෙන අයියාත් සාරංගා අක්කත් සමග කතා කලෙමි .
"නදුන් එන්න අපි යමු "

ඒ මීනුගෙ කටහඬයි මම ඒදෙස බැලුවෙමි මීනු සමග කතා කරමින් සිටි කොල්ලා අර වීල් චෙයාර් එකේ සිටි කෙල්ලවත් තල්ලු කරන් මීනු සමග කතා කරමින් එයි .මට මෙය කුතුහලයකි කවුද එතකොට මේ .මම ඒ ප්‍රශ්නාර්තයෙන් අක්කාගෙ මුහුණ බැලුවෙමි .

"මල්ලි ඒ අපේ නැන්දගෙ පුතා නදුන් අර වීල් චෙයාර් එකෙ ඉන්නෙ එයාගෙ වයිෆ්. "

මල හත්තිලව්වයි මම උදේ ඉදල ඇදගෙනම නාල කියල දැනගද්දි මම වූ ලේට් දැන් කලුගලේ මොකද්ද කරපු බළල වගේ තමයි ඉන්න වෙන්නෙ. මීනු මට ගස්සගෙන වගේ අපිව පහුකරන් නදුන් සමග ගියාය.

"එයාගෙ වයිෆ් ට මක් වෙලාද ඒ? "

"ඒක දිග කතාවක් ඒ චම්මි වෙඩින් එකට සතියක් තියෙද්දි ඇක්සිඩන්ට් උනේ එයාට ආයේ කවදාවත් ඇවිදින්න බැරිවෙයි. ඒත් නදුන් එයාව මැරි කලා ඒක පුදුම ආදරයක් "

දෙයියනේ එච්චර කැපකිරීම් කරපු මනුස්සයෙක් ගැනනෙ මම මෙහෙම හිතුවෙ හොඳ වැඩේ මට දැන් ඉතින් මීනුගෙ මූන බලලත් ඉවරයි.

මීනු ලාගේ නිවසේ අය හවස පිටත් උනත් මීනු නතර උනාය. ඒ A/L ක්ලාසස් පටන් ගන්න නිසාය . ඔවුන් යන වෙලාවෙ නදුන් අයියා චම්මි අක්කාව වඩාගෙන ගොස් මැද දොර ඇර තිබූ වෑන් එකේ සීට් එක මතින් තැබුවේ ඉතාමත් පරිස්සමිනි.

"මට හොඳ ශුවර් එකක් තියනව මගෙ කෙල්ල කවද හරි ඇවිදියි කියල මල්ලි. "
ඔහු කීවේ බලාපොරොත්තු රැඳි දෑසෙන් මා දෙස බලාය .
"අනිවායීයෙන්ම අයියා "
මම පැවසුවේ ඔහුගේ පිටට තට්ටුවක් දමමිනි.
"එහෙනම් අපි ගියා මීනුව හොඳට බලා ගනින්.උඹ කරපු කුප්ප වැඩේට හොඳටම තද වෙලා ඉන්නෙ."
"මො..මො.නවද අයියේ එයා කිව්වෙ. "
"උඹ එයාගෙන් ඇහුවා නේද? ඉතින් ඊට පස්සෙ උඹ වෙන උන් බදාගෙන බැලුම් ඩාන්ස් දැම්මාම හරියනවද? එයා බලන් හිටිය ඔයා එයාට ඉන්වයිට් කරයි කියල. "
හප්පේ මොකේද දැන් වළදන්නෙ මේ ගෑනුන්ගේ වැඩ හින්දනෙ පිරිමි අපි මාරුවේ වැටෙන්නෙ.
"හ්ම්ම් දැන් ඉතින් ඔක්කම ඉවරයි. "
"ඉවර නෑ උඹ ඕක ගොඩ දාගනින්. උඹට තමයි ඕක කවද හරි. ගොන්කන් කරන්න එපා කෙල්ලෙක් ගෙ හිත කැඩුනොත් ආයෙ හදන්න බෑ අනික බන් අහපු ගමන් ආදරෙයි කියන්න ගෑනු කියන්නෙ සෝඩ බෝතල් නෙවෙයි උන් ආත්ම හතකට යනකම් හිතල උත්තර දෙන්නෙ. "
"ඒක ඇත්ත මල්ලි ඔයා කරපු දෙයින් මීනුගෙ හිත හොඳටම රිදිල. "
ඒ චම්මි අක්කාය .
ඔවුන් පිටත් වූ පසුවත් මම කල්පනා කලේ මීනුව යලි යාලු කර ගන්නෙ කෙසේද කියලයි.

දවස් කීපයක් ගියා මීනු මාත් එක්ක කතාවක් නෑ බැරිම තැන මම දවසක් කතා කලා .
"මීනු මට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕන. "
"ඇයි බැලුම්බෝල කෙල්ල කතා කරන්නෙ නැද්ද ? දැන්. "
නෝ චාන්ස් මුන්ගෙ තියන ගනන් දෙයියෝ මොකට ගෑනු කියල ජාතියක් මැව්වද මන්ද.
"ඔයා ඒක අල්ලගෙන ඇයි මාත් එක්ක රන්ඩු කරන්නෙ මම වැරැද්දක් කලේ නැනේ. "
"වැරැද්ද. මට ආදරෙයි කිය කිය වෙන කෙල්ලො එක්ක ඩාන්ස් දැම්මාම හරිද? "
"ඉතින් මම ආදරේ උනාට ඔයා මට ආදරේ නෑනෙ ඒකනෙ මේ අවුල. "
"මේ ෂෙහාන් මට ඔයත් එපා ඔයාගෙ ආදරෙත් එපා දැන් යන්න මෙතනින්. "
හරි රතු කට්ට පැන්න දැන් මාරු උනේ නැත්තම් සදා සොත්තිම තමයි .මම කාමරයට වැදී දොර වසා ගත්තෙමි. අම්මා දොර ලඟට සිට.
"පුතා ඔයාට කෝල් එකක්. "
"කව්ද අම්මා. "
"කවුද දන්නෙ නෑ ගෑනු ළමයෙක්. "
ඒ ගමන මොන මරාලයක් ද කොහෙ කෙල්ලක් ද මොකා උනත් ලෙඩක් ම තමයි මම ෆෝන් එකේ රිසීවරය කනේ තියා ගත්තෙමි .
"හෙලෝ "
"හෙලෝ අයියා අදුනන්න පුලුවන් ද? "
"අදුනන්න ඉතින් ෆෝන් එකෙන් මූන පේන්නෙ නෑනෙ. "

"අයියෝ නපුරා මම නිකිණි නංගියා. "
ඒකි ඇදල පැදල කිව්ව ඔව් ඉතින් ඉල්ලන් දා ගන්න මරාල නෙ දැන් වනගත වෙන්න තමයි වෙන්නෙ.
"කවුද නිකිණි කියන්නෙ. "
මීනු සාලේ පොතක් බලමින් සිටී ඒත් කන නම් ෆෝන් එකලඟ බව ඇගේ ඉරියව් වලින් පෙනේ ඔව් ඉතින් ගෑනු නෙ රහස් පරීක්ශක වැඩ වලට කියාපු බඩු නෙ.
"අයියෝ අයියේ ඔයා එක්ක බැලුම්බෝල ඩාන්ස් දැම්මෙ එදා. "
"ආ කියන්නකො නංගි. "
"මේ හෙට පංසලේ සල්පිලක් තියනව ඔයා එනව නේද? "
"ආහ් එහෙමද කවුද මගෙ ගෙදර නොම්මරේ දුන්නෙ ඔයාට. "
"අනේ ඒකෙන් වැඩක් නෑ නෙ එනවද කියන්නකො. "
"ඇයි පංසලෙත් බැලුම්බෝල ඩාන්ස් එකක් තියනවද? "
"අයියෝ නෑ අනෙ ඔයාටත් හැමදේම විහිලු මැච්චා."
ඔව් ඉතින් මම මැච්ට නෙවෙයි නම් අනේ තියන මැණික විසි කරල කිරිවාන කැට අහුලයි ද දැනුත් මේ ඒවගෙ ප්‍රතිඵල තමයි .
"අනේ නංගි මට එන්න වෙන්නෙ නෑ මම හෙට දා ගත්තු වැඩක් තියනවා මම තියන්නම් බායි "
"හා අයියේ බායි මොනව කරන්නද නේද එහෙනම් ගුඩ් නයිට්. "

"ගුඩ් නයිට් නංගි. "
ඒ එක්කම සාලේ සිටි මීනු නැගිට්ටෙ.
"නැන්දා "යි කියා ගෙනය.
"ඇයි දුව. "
"හෙට සල්පිල බලන්න අපි දෙන්නට තනියම තමයි යන්න වෙන්නෙ. "
හුටා මේ මොන මරාලයක්ද මේ දවස් වල මගෙ ග්‍රහයෝ අන්තිම නරකයි.
"ඒ ඇයි දුව චූටි එන්නෙ නැහැල්ලුද? "
"එයාට ලොකු වැඩක් එන්න වෙන්නෙ නෑ කියල එයාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් ට කියනව මන් අහගෙන. "
මල කෙලියයි මේ මොකක්ද වෙන්නෙ මීනු නියම තැන බලල චකබ්ලාස්ට් වෙන්නම දීල ඇරිය. එහෙනම් බැලුම් ඩාන්ස් එකේ ඉදලම විස්තර අම්මගෙ කනේ තියල ඇති .දැන් නම් වහ කාල කැලෙ හැංගිලා ගඟෙත් පැනල වෙඩිත් තියා ගන්නයි වෙන්නෙ මට .
ආ දැන් එහෙම කෙනෙකුත් ඉන්නවද අම්ම සාලෙට ආවේ හිනා වේගනයි.
දැන්නම් කට වහන් හිටියොත් සදා සොත්ති තමයි නෝන්ඩි වෙනව ඇඩුස් නැති වෙන්නම.
"අනේ අම්මෙ අවුරුදු උත්සවේක බැලුම්ඩාන්ස් දැම්ම කියල ඒ කෙල්ල ගර්ල් ෆ්‍රෙන්ඩ් වෙනවද? ඔහොම පද හදන මිනිස්සුන්ට හොදක් වෙන්නෙ නෑ. "
"දැන් කවුද ෂෙහාන් පද හැදුවෙ ඇයි ඇනුම්පද කියන්නෙ කෙලින්ම කියන දෙයක් මූනට කියන්න "

sinhalaebooks.com

මීනු ගේ වචන වෙඩි වරුසාවක් වගේ පතිත විය ..
 අම්මත් බලන් ඉන්නව.
"නිකිණි කියන්නෙ මගෙ ගර්ල් ෆ්රෙන්ඩ් නෙවෙයි"
"හරි හරි ෂෙහාන් එයා ඔයාගෙ කවුරු උනත් මට කමක් නෑ මොකද මම ඔයාගෙ කවුරුත් නෙවෙයි නේ. "
"දෙන්නම නවත්තගන්න මොකද මේ ගෑනියි මිනිහයි වගේ පටන් ගත්තෙ? චූටි ඔයා ගැන මට නරක නිව්ස් කීපයක්ම ඇවිත් තියෙන්නෙ පරිස්සන් වෙලා ඉන්න. එන්න දුව අපි යමු "
ඒ අම්මා .නියමයි ඔය තියෙන්නෙ මගෙ වෙන්න නැන පොඩ්ඩ ගේම දීල මම කාමරේට ගිහින් දොර වහ ගත්තා අද ඉතින් රෑට නෝම්බි තමයි .ඇයි අම්මත් අවුල් නෙ රෙද්දක් ඇඳන් කොහොමද කෑම මේසෙන් ඉඳගන්නේ චරිතෙ ඝාතනය වෙලානෙ අම්බානකට  .දැන් හෙට සල්පිලට යන්නත් බෑ ගියොත් ඇදගෙන නෑව වගේ තමයි .ශික් උනේ නෑ මෙහෙම නෝන්ඩියක් .වැරැද්ද මගෙ ගොනා වගෙ තප්පුලන්නෙ නැතුව එදා හිටියනම් මේ ප්‍රශ්න නෑ.මට මේව කියන්න කවුද ඉන්නෙ .කවුරුත් නෑ අයියෙක් කියල ඉන්නව උඟ වගේ අයියල පොල්පිත්තකින් කපා ගන්න පුලුවන්. මාව පොඩ්ඩක් වත් ගනන් ගන්නෙ නෑනෙ.යාලුවොත් ඉන්නෙ පාප මිත්‍රයොනෙ උන් එක්ක මේව කියන්න ගියොත් .මට බෙල්ලෙ ගලක් බැඳන් වැවට පනින්න තමයි වෙන්නෙ .
කොහොමින් කොහොමින් හරි මට බඩ ගින්නෙම නින්දගිහින් පසුදා මම උදේන්ම අවදි උනෙමි.ඒ

එක්කම ලොකු බඩගින්නක් යකෝ මගෙ බඩේ හිගන්නෙක් වත් ඉන්නවද මන්ද .හිගන්නෙක් මත් නෙවෙයි ඉයේ රෑ මම නිදා ගත්තෙත් හිඟන්න වගේ නෙ,ඊයෙ රෑ යුද්දෙන් පරාද වෙලා පසුබැස්සනෙ .නාන කාමරයට ගිහින් නාගෙන හිමීට හොර පුසා වගේ කෑම කාමරේට ඔලුව දාල බැලුව.අම්මයි මීනුයි බර කතාවක් මම ඔලුව දැම්ම විතරයි කතාව නැවතුනා .ඒ කියන්නෙ කෙරීගෙන ගිය කතාව මට ගුණ එකක් නෙවෙයි වගේ .මටත් කට තියන් ඉන්න බෑ නෙ..

"අම්මෙ මොනවද මේ කේලමී උදේ පාන්දර කියන්නෙ. "

"කේලමී ,මොනවද පුතා ඔය කතා කරන විදිහ උදේ පාන්දර. "

හුටා අදත් නෝම්බි වෙයි වගේ.

"නෑ අම්ම විහිලුවක් නෙ කලේ මොකද ඔයාල හැමෝම මාත් එක්ක තරහින්. "

"පුතා ඔයා අද සල්පිලට යන්න එන්න ඕනේ. "

"රෙද්දක් ඇඳන් යන්න බෑ නෙ අම්ම. "

"ඔව් ඇන්ටි අර සක්කරවට්ටම ඇවිත් හොර එලිවෙයි කියල වෙන්න ඇති. "

"එලිවෙන්න ඉතින් හොර තියෙන්න එපැයි. "

මම පැවසුවේ හිමිනි.

"පුතා කව්ද ඒ කෙල්ල. "

"මම දන්නෙ නෑ එදා බැලුම් ඩාන්ස් දැම්ම එච්චරයි. "

"ඒ ටිකට ගෙදර නොම්මරෙත් දුන්නද? "

"මම දුන්නෙ නෑ අම්ම. "

sinhalaebooks.com

"එතකොට ඒ ළමය දන්නෙ? සල්පිලට යන්න එන්න ඕනේ ඔයා තාත්තට යන්න වෙන්නෙ නෑ "
"එතකොට සූරිය බංඩාර ප්‍රින්සිපල්ගෙ ගෙදර නොම්මරේ කවුරුත් දන්නෙ නෑ "
මම කට ඇද කර අහද්දි මීනුත් අම්මාත් මුහුණෙන් මුහුණ බලා ගත්තේ දෑස් ලොකු කරගෙනය .
මම ගෙදරින් එලියට බැස්සේ තරහින් පුපුර පුපුර .ගේට්ටුවෙන් එලියට යද්දීම.නාදන් උන්ගෙ තාත්තගෙ පරණ පුට්සයිකලේ පැදගෙන අපේ ගෙවල් පැත්තට එනව .
"පුංචි මහත්තය කොහෙද මේ තනියම. "
"නාදන් මම නිකම් එලියට ආවෙ කියපන් කොහෙද බන් මේ යන්නෙ. "
"පුංචි මහත්තය හම්බෙන්නයි ගියේ. "
"ඒ මොකද? "
"නිකිණි මේක පුංචි මහත්තයගෙ අතටම දෙන්න කිව්ව. "
"හුටා ලිවුමක් නේද කෝ දියන් බලන්න. "
ජීවිතේට ඉතින් කෙල්ලක් ලියුමක් දීල තියනව යෑ ආසාවෙන් ඒක දිග හැරියා.
'ෂෙහාන් කියන නපුරට ..නපුරෝ ඔයා සල්පිලට එනවා නේද නාදන් අයියට පණිවිඩය කියන්න ඔන්න මම ඔයා එනකම් බලාගෙන ඉන්නව. '
"අනේ බන් නාදන් මේක මල ඇනයක් ඕක ආරන්චි වෙලා මට ඉයේ රෑ කෑමත් නෑ අද උදේටත් නෝම්බි මේ ඔක්කොම අර තම්බිය හින්ද තමයි. "
"යකෝ උඹ උදේ පාන්දර තම්බිය තම්බිය කියල මටද බනින්නෙ. "

මොහොමඩ් අප දෙසට එමින් සිටියේ ය .
"ඔව් ඉතින් තොට තමා මොකක් ද බන් අර මරාලෙ දැන් ගෙදරටත් කෝල් කරනව මූ අනෙ ලියුම් එවනව,මම ආදරේ මීනුට විතරයි මේ වැඩ වලින් වෙන්නෙ මට වහ කන්න තමයි. "
මම සිදු වූ සියල්ල උන් දෙන්නට පැවසීමි .ඒක අහගෙන ඉදල මුන් දෙන්න පහක් දාලා වැඩේ හරි කියල උඩ පනින්න ගති .යකෝ මුන් දෙන්නට පිස්සුද?
 කතා කලේ මොහොමඩුයි.
"මචන් අපි දෙන්නයි සුපුනුයි ඕක ප්ලෑන් කලෙ මීනු උබට ඇත්තටම ලව් ද බලන්න.. "
"ඒ කිව්වෙ. "
"ඒ කිව්වෙ නිකිණි කියන්නෙ බන් අපේ අංජනයගෙ ගර්ල්ෆ්‍රෙන්ඩ්. "
"අංජන කිව්වෙ අර සුපුන් ලගෙ මාමගෙ පුතාද? "
"අන්න හරි උඟත් දන්නව මේ ගේම මචන් අපිට ඕන උනේ මීනු උඹට ලව් ද කියල බලා ගන්න. දැන් එයා හැසිරෙන විදිහෙන් තේරෙනව එකි උඹට ලව් බය නැතුව හිටපන් අපි ඉන්නවනෙ. "
"ඉන්නවනම් තමයි අපි බලමු කො. "
මුන් ටික එල  හරක් රට තනකොළ කනව වගේ වැඩේ කයි ද .මුන් කරපු ටිකෙන් කෑම වේලටත් කෙල උනා ඒ වගේම බෙල්ල ලඟින් ගහල යයි ද දන්නෙත් නෑ නෙ . මම ගෙදර ගියේ සල්පිලට යන්න ලෑස්ති වෙන්න ඕන නිසා .

හවස හයට විතර අපි සල්පිලට යන්න ලෑස්ති උනා කාර් එකේ මම රියදුරු අසුනේ වාඩි උනත් වෙනදා ඉස්සරහ අනිත් සීට් එකේ වාඩි වෙන මීනු අම්මත් සමග පිටුපස අසුනේ වාඩි උනා .

“මදැයි කොලා අද මට වෙන්නෙ නිකම්ම ඩ්‍රයිවර් වෙන්න ”

මම මටම හිමීට කියා ගත්තා

“මොනවද චූටි තනියම කුටු කුටු  ගාන්නේ ”

අම්මා ඇහුවෙ හිනා වෙමින්

“නෑ අම්මා මම නිකම ඩ්‍රයිවර් උනා කියල කිව්වේ ”

අපෙ අම්මටත් ඕනෙ නැති මගුලක් නෑ .

මම පංසලට වාහනය පැදවූයේ වෙනදාට වඩා හිමින් මගෙ යාලුවො මොනවා කිව්වත් මේ පෙරලිලා තියන බාල්දි මදිවට තව මොන මරාලයක් කඩා වැටෙයිද දන්නෙ නෑනෙ.මගෙ ග්‍රහයො ටික ඒ තරමටම සවිත්තුයි .

අම්මවයි මීනුවයි ගේට්ටුව ගාවින් බස්සල මම පංසලේ කාර්පාර්ක් එකේ කෙලවරට වෙන්න කාර් එක නවත්තල බැහැගත්ත.මම එනකොට අම්මයි මීනුයි නොපෙනෙන දුරට ගිහින් .මට දහස් ගණනක් සෙනග අතරෙ ලොකු පාළුවක් දැනුනා .මීනුගෙන් ප්‍රතික්ෂප වෙන්න හේතු උනේ අර බැලුම් ඩාන්ස් එක ඉතින් මේ අවුල ලෙහා ගන්න වෙන්නෙත් එතනින්මයි ලෙහන්න ගිහින් පැටලෙන්නත් බැරි නෑ .

“ෂෙහාන්  මොකද බං වෙලා තියෙන්නෙ කී පාරක් කතා කලාද උඹට ”

ඒ මොහොමඩ්

sinhalaebooks.com

"ආහ් උඹත් ආවද මම පොඩි කල්පනාවක ආවේ බං කෝ බං අනිත් දෙන්න "
"සුපුන ගියා නාදන් එක්ක එන්න දැන් ලඟම එනව ඇති "
"ඔක්කම අවුල් බං "
"ඇයි "
"අර අවුරුදු උත්සවෙන් පස්සෙ මීනු මාත් එක්ක කිසිම කතාවක් නෑ මේවට උඹලත් වග කියන්න ඕනේ "පොඩ්ඩක් ඉවසපං කෙල්ලො එක පාරටම කැමැත්ත දෙන්නෙ නෑ "
"උඹලගෙ ගොං වැඩ හින්ද දැං කොහොම කැමති වෙන්නෙත් නෑ බලපං අද නිකිණි පංසලට ආවොත් "
"පිස්සුද බං එහෙම අවුල් වෙන්නෙ නෑ "
ඒ හඬ ඇසුනේ පිටුපසින් .
ඒ සුපුනුයි නාදනුයි
"හා හා ඉක්මනට යමු නැත්තන් තැනක් අල්ල ගන්න වෙන්නෙ නෑ "
නාදන් ඉස්සර උනේ හරියට අපි පරක්කු උනා වගෙයි .
අපි යන විට සල්පිල පටන් ගන්න සියලු දේ සූදානම් වෙමින් තිබුනා .අම්මාත් මීනුත් පසෙක තබා තිබූ පුටු දෙකක හිඳගෙන සිටි අතර ගමේ වැදගත් පවුල් කිහිපයක කාන්තාවන් කිහිප දෙනෙක්ම අසල තිබූ අනෙකුත් පුටුවල වාඩිවී සිටියා.මීනු කිහිප වරක්ම මා දෙස බලා අහක බලනු මම කිහිප සැරයක්ම දුටුවා.
මේ අතර සල්පිලත් පටන්ගත්තා .

sinhalaebooks.com

"ඕන් පුංචි මහත්තය වෙලාව "
නාදන් මගෙ කනට කර පැවසුවා .
"ඇයි නාදන් "
"ඇයි කියන්නෙ සල්පිලෙන් මොනව හරි අරන් මීනුට දීපං "
එයට පිලිතුරු දුන්නෙ මොහොමඩ් .
"මොනව අරන්දෙන්නද බං"
"ලාබෙට බුලත් විටක් තියනව ඒක අරන් දෙමු ."
විසුළු මුහුනක් මවාගෙන පැවසුවේ සුපුනුයි .
"බුලත් විටක් ?? මම දෙනව උඹට හොඳ විටක් "
මම කීවේ උගේ පිටට තට්ටුවක් දමමිනි
"මම කිව්වෙ ඇත්තටමයි පුංචි මහත්තය මේක තමයි මීනු මිශ් ව ශේප් කරගන්න වෙලාව. "
නාදන් කිව්වෙ මා දෙස බලමිනි .
මොනවද අරන්දෙන්නෙ බං මම ඇසුවේ තිදෙනාගේම මුහුණු බලමිනි
"මතක හිටින දෙයක් ගමු "
ඒ සුපුන් ගේ හඬයි .
"මචං මම දැක්ක මරු බඩුවක් "
"මොනවද මොහොමඩ් "
"පොල් කටුවලින් හදපු පෙන්ඩන්ට් වගයක් තිබුන"
"වැඩක් නෑ බන් ඕවගෙන් ශේප් වෙන්නෙ නෑ බං බලමුකො "

මම කීවේ ඉවත බලමිනි .

කාලය ටිකෙන් ටික ගත උනා .මේ අතර උසස්පෙල පන්ති ආරම්ඹ උනා .මීනුත් මමත් උසස් පෙල කලේ

ජීව විද්‍යාව අංශයෙන් ය .මීනුත් මාත් අතර ඉස්සර වගෙ කිට්ටු කුලුපගකමක් දැන් නැත කතා කලත් ඇවැසිම දේකට පමණි.කමක් නෑ සුදු ඔයා දවසක මගෙ ආදරේ තේරුම් ගනීවි .මම ගැටලුව කාලයට බාර දුනිමි.

කාලයට බාර දුන්න වගේ නෙවෙයි වෙන හෝතඹුවෙක් හොට දායිද කියලයි බය .

මීනුගේ අක්කාගේ ත් මගේ අයියාගේත් විවාහයට සියල්ල සූදානම් විය .මම එදින දෙවන මනමාලයා ලෙසත් මීනු දෙවන මනමාලිය ලෙසත් සිටියෙමු .විවාහය පැවතුනේ කුරුණෑගල හොටෙල් එකකය .මගේ මවත් මීනුගෙ මවත් සතුටු සාමිචියකය.

කතා කරන්න දේවලුත් ඇතිනෙ දැන් යාලුකම නෑදෑකමකටත් පෙරලුනා නෙ .මම මීනු හිටි සැටියේම වාඩි වී සිටියෙමි .හයියෝ එපා වෙනව ෆොටෝ ගන්නයි එවා මේව ගොඩයි සාරංගා අක්කගෙ යාලුවෙක් තමයි ෆොටෝ වීඩියෝ දෙකම කලේ."කියාෂා මීඩියා ක්‍රියේශන් " එකේ ඕනර් කුෂාන් අයියම තමයි ශූට් එකට ඇවිත් හිටියෙ .ඌ නම් ජෝර්ක් කර කරම තමයි වැඩේ කලේ.ඌ වැඩියෙන් ම ජෝර්ක් කලේ අපි දෙන්නට ඒවට මීනුත් හිනා වෙනව .සමහර විට අපි දෙන්න මැච් වෙනව කියල උට ත් පේනව ඇති. මේ රට හාවිට තේරුනේ නැති උනාට.ඒහින්දම වෙන්න ඇති අපි දෙන්නගෙ කපල් ෆොටෝ එක ගත්ත වෙලේ මටයි මීනුටයි අතට අත දෙන වෙලාවෙ එයා කිව්වෙ .

"මල්ලි උඹල දෙන්න මම දැකපු හොඳට මැච් වෙන කපල් එකක් කියල. "

මෙහෙම මනෝ පාරක් ගහගෙන ඉද්දි තමයි අම්මත් මීනුගේ අම්මත් අපි ලඟට ආවෙ
"මදාරා මේ ජෝඩුව ඔක්කටම වඩා මැච්වෙනව වගේ නේද? මේ දෙන්නගෙ මැරේජ් එකත් දැම්මම කෙරුවනම් හරි නේද? "යි කිවාය.
අම්මත් හිස සොලවා එය අනුමත කලාය .
ශික් වස නෝන්ඩිය මම බිම බලාගත්තෙ ලැජ්ජාවටමයි මම හිමීට වෙන තැනකට යන්න නැගිට්ටෙමි .එවිටම කෙනෙක් මගේ සුරතින් ඇල්ලුවාය .මම පිටුපස බැලුවෙමි .ඒ මීනුයි ඇය මගේ අතින් ඇල්ලු ප්‍රතම වතාව මෙය විය .එම නිසා දෝ ඇගේ අතේ උණුසුම මට හොඳට දැනුනි.
"ෂෙහාන් අපි පොඩ්ඩක් එලියට ගිහින් එමු "යි ඇය පැවසුවාය යකෝ ඉවසපන් පපුව මේ මොකක්ද වෙන්න යන්නෙ යමුකො යමුකො බලන්නත් එක්ක.අපි වැඩිය කවුරුත් නැති ගාර්ඩන් එකෙ කෙලවරකට ගියෙමු .
"ෂෙහාන් ඔයා මාත් එක්ක තරහ වෙලාද ඉන්නෙ. "
"නෑ තරහ වෙන්න අපි දෙන්න අතර විශේෂ යාලුකමක් නෑ නෙ මීනු. "
"විශේෂ යාලු කමක් නෑ ,ඔයාට මාව පොඩ්ඩක්වත් විශේෂ නැද්ද? "
මීනු මගේ මුහුණට එබී ඇසුවේ අඬන්න ලං වී වගෙයි.
"මම ඔයාව මට විශේෂම කෙනා කරගන්න හදද්දි ඔයා ඈතට ගියා මීනු, මට දැන් විශේෂ කියල කෙනෙක් නෑ. "

KUSHAN HETTIARACHCHI

"ෂෙහාන් ගෑනුළමයි එකපාරට ඔයවගේ දේවල් වලට උත්තර දෙන්නෙ නෑ හුඟක් හිතනව එයාල දෙයක් කරන්න කලින්. "
යාලුවනේ මම අදත් ඇන ගනියි නේද මැටි මෝලා වගේ ....
"දැන් මොනවද හිතුවෙ "
"හිතුවෙ ෂෙහාන් එදා ඔයා අහපු දේට මම කැමතියි. එදා මට එක පාරටම දෙන උත්තරේ මොකක්ද කියල හිතා ගන්න බැරි උනා. පොඩි කාලෙ ඉඳලම මම ඔයාට කැමතියි එත් මම හිතුවෙ නෑ ඒක ආදරේකට පෙරලෙයි කියල. ඇත්තටම මම ඔයාට ආදරෙයි. "
අම්මෝ මම මේ දකින්නෙ හීනයක්දෝ මම පොඩි තට්ටුවක් කම්මුලට දැම්මෙමි නෑ නෑ හීනයක් නෙවෙයි .
"මොකද මෝඩයෝ බය වෙලා වගේ අපිට ගොඩක් ප්‍රශ්න එයි සමහර විට අපි ඒවට මූහුණ දෙමු බබා මම මේවා හුඟක් කල් හිතේ හිරකරන් ඉඳල කිව්වෙ ඔයාව අද සතුටින් තියන්න ඕන නිසා නැත්තන් මම මේක කියන්නෙ ඒ ලෙවල් වලින් පස්සෙ. "
මම මීනුගේ අත අල්ලා ගත්තෙමි ඒ අතසීතල වී තිබුනි සිනිදු අත මම තවත් මගේ සුරතට ග්‍රහනය කර ගත්තෙමි .මීනු තවත් මා වෙත ලං විය.
"ෂෙහාන් කියන්න ඔයා මට ආදරෙයි නේද? "ඇය හුරතල් ලෙස මා වෙත ලං වී පොඩි දැරියක් සේ කට උල් කර මා ගෙන් විමසුවාය .

"මීනු මම ඔයාට හැර වෙන කාට ආදරේ කරන්න ද මැණික. "
"ඔය ඇත්තමද මගෙ මහත්තයෝ. "
ඇය තවත් මට ලං උනාය මම ඇයව තදින් වැළඳ ගත්තෙමි .
අපි බොහෝ වේලාවක් එසේ ගත කලෙමු මීනුගේ සිනිදු හිසකෙස් අත ගෑවෙමි මගේ අහිංසක සිහිනය සුන්දර ලෙස සැබෑ විය. මම පැතූ ආදරය මට හිමි විය.
අයියා විවාහයෙන් පසු ගෙදරම නතර විය මේ අතර අපි උසස්පෙල විභාගයටද වාඩිඋනෙමු.නිවාඩු කාලයේ මීනු අපේ නිවසේම රැඳී සිටියාය .මේ අතරම සාරංගා අක්කට මහනුවර මහ රෝහලටම පත්වීමක් ලැබී තිබුනි .
උසස්පෙල ප්‍රතිඵල නිකුත් විය මමත් මීනුත් සරසවි යාමට අවශ්‍ය සුදුසුකම් සපයා තිබුනි මීනු ටිකකලකට නිවසට ගියාය .
නාදන් උසස්පෙල සමත් වී තිබූ නමුත් සරසවි යාමට ප්‍රමානවත් තරම් ලකුනු නොතිබිනි ඔහුට අපේ තාත්තා කොළඹ තාත්තගෙ යාලුවෙකුගේ ඔෆිස් එකක රැකියාවක් ලබා දුන්නේය ,මොහොමඩ් වැඩිදුර ඉගනීමට එංගලන්තය බලා පිටත් විය. යාලුවො කියා ගමේ ඉතුරු වූයේ සුපුන් පමණි. ඔහුත් තව ටික දවසකින් වැලිමඩ ඔහුගේ නැන්දාගේ නිවසට යනු ඇත .
මේ අතර සාරංගා අක්කාට දරුවෙකු ලැබින. ඒ ලස්සන රෝස පාට දූ සිඟිත්තකි අයියාගේ සතුට

ඉහවහ ගොසින් ය . අක්කාගේ තීරණය උනේ නිවාඩු කාලය අක්කාගේ නිවසේ ගත කිරීමයි.
ඒ නිසා ඇය එහි යාමට සූදානම් උනවාය .
අයියාටත් තාත්තාටත් වැඩ අදික වූ නිසා .අක්කාව ඇරලවීම බාර උයේ මටයි මා එය සතුටින් බාර ගතිමි මන්ද ට මීනුව දැක ගැනීමට මෙය අවස්තාවක් බැවිනි ඇය නැතිව හුඟක් පාලුවෙන් මම මේ දින ටික ගත කලේ .

අක්කත් මාත් පිටත් වූයේ කාරයෙනි යන අතර මගදී සින්දුවක් සිවුරුහන් බාමින් මම වාහනය පැදවීමි .අක්කා සිනාසෙමින් මෙසේ පැවසුවාය
"කොල්ල දැන් ටික කාලෙක ඉදල හුඟක් සතුටින් වගේ "
මම සිනා සීමි
"ඇයි කවුරු හරි කාන්තාරයට වසන්තයක් උදා කලාද ?"
"ඔව් ඔව් අක්කෙ "
"කවුද ඒ වාසනාවන්ති? "
"එයත් ඉන්නෙ අපි මේ යන පාරෙම තමයි අක්කෙ "
"මම අක්කට මුන ගස්සන්නම් කෝ "
ඇයද මගේ හිතේ රජ වූ සුරංගනාවිය දැකීමේ නොනිත් ආශාවෙන් ගමන් ගත්තාය. කෙමෙන් කෙමෙන් අපි නිවසට ලඟා වීමු.කාරය නිවසේ නැවැත්වූ පසු අක්කා මගෙ මූන දෙස බැලුවේ අමුතු සිනාවක් මුව දරාගෙනයි ,ඒ සිනාවෙන්ම පෙනුනේ මගේ ආදරය ගැන සියල්ල ඇයට වැටහුන බවකි .

KUSHAN HETTIARACHCHI

"මල්ලි ඔයාගේ වසන්තය උනේ මීනු නේද? "
"ඔව් අක්කෙ " මම හිස වැනීමි
"කවද ඉදන්ද මල්ලි? "
"අක්කලාගෙ වෙඩින්ග් එක දවසෙ තමයි එයා මට මුලින්ම කැමැත්ත දුන්නෙ. "
"මටනම් හරි සතුටුයි " ඇය ඇවසුවාය .
ඉන්පසු ගෙවුනු හෝරා කීපය සුන්දර හෝරා කීපයක් උනා.
මම ආපසු එන්න ලෑස්ති වෙද්දී මීනු කීවේ අද නැවතී යන ලෙස ය.
ඉතින් මම ගෙදරට කතා කර අද මම කුරුණෑගල නතර වන බව කීවෙමි. .සාරංගා අක්කා මගෙත් මීනුගෙත් සම්බන්දය ඇගේමවට පවසා තිබුනි මීනු ගෙ මව සහ පියා ඉතාමත් සතුටු වූ බව ඔවුන්ගේ මුහුණු වලින් පෙනුනි.
"ෂෙහාන් පුතා එකම ගෙදරින් කෙල්ලො දෙන්නෙක් ගේන්න පුතාලගෙ අම්මල කැමති වෙයිද? දන්නෙ නෑ නේද? "
මීනුගේ අම්මා අසද්දී.
"නෑ ඇන්ටි අපේ අම්මයි තාත්තයි එහෙම පටු අදහස් තියන අය නෙවෙයි මොනව උනත් අපේ අම්ම මීනුට අකමැති වෙන්නෙ නම් නෑ. "
මම කීවෙමි .
ටික දිනකින් පවුල් දෙකේම අය මේ ගැන දැන ගත්තෝය .මම හිතුවාටත් වඩා හොඳ ප්‍රතිචාර අපගේ නිවසින් ලැබුනි.

************වසර හයකට පසු **********
අද මගේත් මීනු ගේත් විවාහ උත්සවයයි හැමෝම සතුටින් සිටී. මේ වසර හයටම මීනුත් මමත් හුඟක් සතුටින් ගතකලෙමු. අද වන විට මම සහ ඈය අපගේ ජීවිතයේ හුඟක් ජයග්‍රහන හිමිකරගෙන ඇත්තෙමු. ඇයත් මමත් වෛද්‍යවරුන් ලෙස වැඩ බාර අරන් දැනට අවුරුද්දක් පමණ ගතවී ඇත .අද දින හැමෝම සතුටිනි .මොහොමඩ් නාදන් සුපුන් අපගේ විවාහ උත්සවයට අද පැමිණ සිටී .අද වන විට අප සියලුදෙනාම හොඳ තැන් වලය සතුට නම් එයයි .නාදන් ට දැන් තමන්ගේම ව්‍යාපාරයක් ඇත මොහොමඩ් දැන් ඉංජිනේරුවරයෙකි .සුපුන් දැන් හොඳ එලවලු මුදලාලි කෙනෙකි .තවත් විශේෂ දෙයනම් නදුන් අයියා ප්‍රාර්තනා කල ලෙසම චම්මි අක්කා දෙපයින් ඇවිදීමයි .
මේ විදිහට මීනුගේත් මගේත් ආදර කතාව අවසන් වෙයි .
නිමි

ස්තූතියි

කුෂාන් කුෂී ^

Author -Kushan Hettiarachchi 2017 JUNE

KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com


# ආදර මීනු

"එහෙනම් කට්ටියම උදේ සෙට් වෙමු. "
"එහෙනම් දැන් මැච් එකක් ගහමු " ඒ සුපුන් ය.
මම එදා ගෙදර එනකොට හවස හතත් පසුවී තිබුනි...
මම ගෙට ගොඩවෙනකොටම අම්මා

"චුටි පුතා හෙට ඉඳන් මීනු මෙහෙ නතර වෙන්න එනවා. " .

"ආහ් අම්මා හෙට නිවාඩු හින්ද මම උදේ ගමනක් අන්න දාගත්තනෙ. "

"කොහෙ රවුම් ගහන්න යනවද මේ ළමයා? "
"නාදන් ලගෙ කෝවිලේ හෙට පූජාවක් අපි යාලුවො හැමෝම යනවා අනික මීනු එන එක මට එච්චර වැදගත් කමක් නෑනෙ අම්ම. "
"මොනව චුටි ඇයි එහෙම කියන්නෙ ඔයා මොකක්ද ඔච්චරම එයා එක්ක තියන තරහ. "
"මම ඒ ආඩම්බරකාරීට කැමති නෑ. "
"අපෝ එකද මේ කෙල්ලො කොහොමත් ආඩම්බරයි ඔය මීනුගෙ අම්ම වසන්තිත් එහෙම තමයි ඉස්සර ආඩම්බර කම ගැහැණු ළමයින්ට උපතින්ම එන දෙයක් නෙ පුතා. "
"ඉතින් අම්මා ගෑනුන්ට උපතින් ආඩම්බර කම එනව කියල පිරිමි අපිට පාං ද? ඉතින්.අම්මගෙ තර්කත් ඉතින් ගෑනුන්ටම තමයි හරියන්නෙ මම යනව වොශ් දාන්න නැත්තන් ඔයාගෙ දේශනා අහල මට නාගන්නත් බැරිවෙනව. "




කුෂාන් හෙට්ටිආරච්චි
www.facebook.com/kushan3000
kushan3000@gmail.com